**රත්නපුර මහා නගර සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**-----------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 පෙබරවාරි 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 මැයි 31 දින සභාවට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**-----------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට රත්නපුර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**-------------------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ දී වැඩියෙන් දක්වා තිබුණු මෝටර් රථ හා කරත්ත ගිණුමේ රු. 550,000 ක් වූ ආරම්භක ශේෂය සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් මඟින් නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ආ) | කර්මාන්තයක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ලැබිය යුතු රු. 975,201 ක් ගිණුම්ගත කර නොතිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී ගැලපුම් කිරීම සඳහා සටහන් කර ගතිමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දී මිලදීගත් හා පරිත්‍යාග වශයෙන් ලැබුණු රු. 249,872 ක් වටිනා පුස්තකාල පොත් ගිණුම්ගත කර නොතිබුණි. | මිලදී ගැනීම් හා පරිත්‍යාග නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනයට ගැලපුම් කිරීම සඳහා සටහන් කර ගතිමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී ඉඩමක් පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක තැන්පත් කරන ලද රු. 4,200,000 ක් ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනයට ගැලපුම් කිරීම සඳහා සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රතිපාදන මත ඉකුත් වර්ෂයේ නිමකර තිබූ කර්මාන්ත 03 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු. 582,734 ක් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | ඉකුත් වර්ෂයේදී නිමකර තිබූ කර්මාන්ත 03 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී ලැබුණු රු. 667,388 ක් වෙනුවෙන් ණයහිමි වෙන්කිරීමක් සිදුකර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනයට ගැලපුම් කිරීම සඳහා සටහන් කර ගතිමි. |
| (උ) | ඉකුත් වර්ෂයට අදාලව ගෙවන ලද රු. 86,065 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනයට ගැලපුම් කිරීම සඳහා සටහන් කර ගතිමි. |
| (ඌ) | සභාවේ ජංගම ගිණුම් 03 ක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා සාරාංශ මුදල් පොත් අනුව ශේෂය අතර එකතුව රු. 11,918,583 ක වෙනසක් පැවතුණි. | වෙනසට හේතු හඳුනාගෙන නිරවුල් කළ යුතුවේ. | දැනට මෙය පරීක්ෂා කරමින් පවතින අතර වරද සොයා ගැනීමෙන් අනතුරුව එය 2019 වසරේ ගිණුවල නිවැරදිව දක්වමි. |
| (එ) | සේවක ණය ලැබීම් රු. 128,050 ක් අඩුවෙන් හා සේවක ණය ගෙවීම් රු. 160,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | සේවක ණය ලැබීම්වල සාරංශ මුදල් පොතේ අඩුවෙන් දක්වා තිබූ රු. 128,050 ක මුදල නිවැරදි කල අතර ගෙවීම් වශයෙන් දක්වා ඇති රු. 160,000 ක මුදල 2019 මූල්‍ය ප්‍රකාශනයට ගැලපුම් කිරීම සඳහා සටහන් කර ගතිමි. |
| (ඒ) | තානායම් කුලිය රු. 1,123,888 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. | උපචිත පදනම යටතේ තානායම් කුලී බිල් කිරීම් රු. 2,275,630 ක මුදල ගිණුම්ගත කොට ඇත. |
| (ඔ) | ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 31,731,157 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛනවල ඇතුලත් ශේෂ නිවැරදිව දැක්විය යුතුවේ. | 2019 වසරේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. |
| (ඕ) | ආදායම් ශීර්ෂ 05 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ශේෂයන් හා උපයෝගී ලේඛනවල ශේෂයන් අතර රු. 688,845 ක වෙනසක් විය. | මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛනවල ඇතුලත් ශේෂ නිවැරදිව දැක්විය යුතුවේ. | මෙම ගිණුම් ශේෂ අතර පවතින වෙනස්කම් කඩිනමින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ක) | එකතුව රු. 2,159,688 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් පරීක්ෂා කිරීමට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදිය යුතුවේ. | සනාථන ලිපි ඉල්ලා යවා ඇති අතර, සනාථන ලිපි ලැබුණු පසු ලෙජරය හරහා ගිණුම් පියවීමට කටයුතු කරමි. |

## 1.4 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 | 2001 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදයට අදාල රු. 3,671,229 ක් වටිනාකමැති ඉකුත් තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ආදායමට ගතහැකි තැන්පතු හඳුනාගෙන ආදායමට බැර කිරීමට කටයුතු කරමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 හා 3.3 ඡේද | සභාව සතු වාහන 18 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණු අතර වාහන 03 ක ඉන්ධන දහනය සම්බන්ධයෙන් නිරීක්ෂණය වූ වෙනස්කම් පිළිබඳව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 68,672,792 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 90,472,449 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2018 2017

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 30,500,000 | 29,175,731 | 26,021,465 | 28,962,158 | 32,000,000 | 31,088,136 | 30,494,091 | 26,806,840 |
| (ii) | කුලී | 68,398,946 | 66,152,480 | 63,173,522 | 28,362,641 | 63,165,069 | 70,584,039 | 66,602,133 | 27,986,516 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 4,723,000 | 3,073,149 | 3,073,149 | - | 5,997,100 | 2,424,403 | 2,424,403 | - |
| (iv) | වෙනත් ආදායම් | 77,862,450 | 78,936,190 | 47,332,292 | 37,628,458 | 74,524,800 | 64,260,941 | 64,370,364 | 18,342,730 |

## 2.2.2 කුලී

### බිම් බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | නේවාසික, වාණිජ හා වගා කටයුතු සඳහා විවිධ පුද්ගලයින් වෙත මහා නගර සභාව සතු භූමි ඒකක 468 ක් වාර්ෂික බදු පදනම මත ලබා දී තිබුණි. 2014 සැප්තැම්බර් මස 11 දිනැති මහා සභා රැස්වීමේ අංක 6:1 දරන සම්මුතිය මගින් තක්සේරුගත බදුකුලියෙන් සියයට 25 ක් නේවාසික ස්ථාන සඳහාද, සියයට 50 ක් ව්‍යාපාරික ස්ථාන සඳහා ද අයකිරීමට තීරණය කර තිබුණි. නියැදි පරික්ෂාවට අනුව, බදු කුලියෙන් සියයට 50 ක් හෝ අයකිරීමට කටයුතු කර නොතිබුණු බදුකරුවන් සිව් දෙනෙකුගෙන් රු. 2,525,750 ක් සමාලෝචිත වර්ෂය වනවිට අඩුවෙන් අයකර තිබුණි. | සභාව විසින් ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2014 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබූ තක්සේරු මුදල ඉතා විශාල අගයක පැවතුණි. මෙවැන්නක් ප්‍රථම වරට සිදුවූ බැවින් මහා නගර සභා ආඥා පනතේ 239 වගන්තියේ ප්‍රතිපාදන යටතේ 2014 සැප්තැම්බර් 11 දිනැති සභාවේ 6.01 සම්මුතිය මගින්, ලද තක්සේරුවෙන් සියයට 25 ක් නේවාසික කටයුතු සඳහාද වෙළඳ හා වාණිජ කටයුතු සඳහා සියයට 50 ක් ද ලෙස අය කිරීමේ තීරණයකට එළඹ තිබුණි. බදුකරුවන් පෙළඹවීමට හා පීඩාවන්ට පත් නොකිරීමට ගනු ලැබූ මෙම සභා තීරණය මගින් සභාවේ ආදායම කිහිප ගුණයකින් වැඩි වූ බව කාරුණිකව දන්වමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසාන වනවිට බිම්බදු ඒකක 300 ක ගිවිසුම් අළුත් කර නොතිබුණු අතර නියැදි ක්ෂේත්‍ර පරීක්ෂාවට අනුව වාර්ෂික බිම් බදු ගිවිසුමේ කොන්දේසි වලට පටහැනිව හා සභා අනුමැතියකින් තොරව බදු ඉඩම් වල ස්ථිර ගොඩනැගිලි ඉදිකර ඇති අවස්ථා 10 ක් හා බදු දේපල වෙනත් පාර්ශව වෙත පවරා ඇති අවස්ථා 06 ක් නිරීක්ෂණය විය. | බිම්බදු ගිවිසුම් නියමිත කාලවලදී අළුත්කර එම ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | විගණන දිනය වනවිට බිම්බදු ඒකක 300 ක ගිවිසුම් අළුත් කිරීමේ කටයුතු සිදුකර නොතිබුණත් මේවන විට ගිවිසුම් 249 ක් පමණ අළුත් කිරීමේ කටයුතු හා බදු අයකිරීමේ කටයුතු අවසන් කරමින් පවතී. |

**2.2.3 බලපත්‍ර ගාස්තු**

**------------------**

**පරිසර බලපත්‍ර**

**------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත ප්‍රකාරව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා නොගත් කර්මාන්ත හඳුනාගැනීමට සභාව විසින් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබීම හේතුවෙන් බලපත්‍ර ලබා නොගත් ආයතන 06 න් හා බලපත්‍ර අළුත් නොකරන ලද ආයතන 12 න් ලැබිය යුතු ආදායම රු. 72,000 ක් වී තිබුණි. කර්මාන්ත වලින් පරිසරයට වන බලපෑම පිළිබඳ ඇගයීමක් සිදුකර නොතිබීම හේතුවෙන් සහා බල ප්‍රදේශයේ පරිසර ආරක්ෂණය සම්බන්ධයෙන් සභාවේ වගකීම ප්‍රමාණවත් පරිදි ඉටුකර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගතයුතු සියළු ආයතන වෙත විධිමත් පරිදි බලපත්‍ර නිකුත් කිරීමට හා පරිසරය ආරක්ෂා කිරීමට සභාව කටයුතු කළ යුතුවේ. | මේ වනවිට පරිසර බලපත්‍ර ලබාදිය යුතු ස්ථාන හඳුනා ගැනීමට කටයුතු කර ඇති අතර ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීමේ කටයුතුද සිදු කර ඇත. එමෙන්ම මෙම ආයතනය සඳහා පරිසර නිළධාරියකු අත්‍යවශ්‍ය බැවින් හා පරිසර කමිටුව සඳහා නියමිත සංයුතියෙන් යුතුව නිලධාරීන් අනුයුක්ත කර කර්මාන්ත පරීක්ෂා කර නීති විරෝධීව පවත්වාගෙන යනු ලබන කර්මාන්ත සඳහා නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීමට නියමිතය. |

**2.2.4 වෙනත් ආදායම්**

**-------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය -- | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහා නගර සභා බල සීමාව තුල ප්‍රදර්ශනය කර ඇති ස්ථිර දැන්වීම් පුවරු 62 කින් සමාලෝචිත වර්ෂයට අදාළව අයවිය යුතු ගාස්තුව රු. 3,912,097 ක් වූ අතර තාවකාලික දැන්වීම් පුවරු 27 කින්, කටවුට් 17 කින් හා බැනර් 01 කින් අයවිය යුතු ගාස්තුව රු. 507,300 ක් විය. | සභාව වෙත ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුවේ. | දැන්වීම් පුවරු සඳහා මුදල් නොගෙවන ආයතන වෙත අදාල ගෙවීම් කරන ලෙස අවස්ථා කිහිපයක දී ලිඛිතව දන්වා යවා ඇතත් මෙතෙක් මුදලින් නොගෙවූ ආයතන සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත.<br>අනවසරයෙන් ප්‍රදර්ශනය කරන තාවකාලික දැන්වීම් පුවරු සම්බන්ධයෙන් ඉදිරියේදි කටයුතු කිරීමට තීරණය කර ඇත. |

**2.2.5** **උසාවි දඩ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,235,375 ක් විය. | සභාව වෙත අයවිය යුතු ආදායම් අප්‍රමාදව අයකර ගත යුතුවේ. | 2018 ජනවාරි සිට 2018 දෙසැම්බර් දක්වා රු. 150,000 ක මුදලක් 2019 මාර්තු 19 දිනදී ආයතනය වෙත ලැබී තිබුණි. |

**2.3** **අධිභාර**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණකාධිපති විසින් 2018 පෙබරවාරි 14 දින නිකුත් කළ රු. 119,350 ක අධිභාර සහතිකය සඳහා තවදුරටත් රු. 59,350 ක් අයවිය යුතුව පැවතුණි. | අධිභාර මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිටපු නාගරික කොමසාරිස් වෙත පනවා තිබූ රු. 119,350 ක අධිභාර මුදලින් රු. 60,000 ක් ගෙවා ඇති අතර ඉතිරි මුදල ගෙවීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කාර්යසාධනය**

මහා නගර සහා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර අනුමත කරගත යුතු අතර, ඒ අනුව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාළ ක්‍රියාකාරී සැලැස්මක් මේවන විට සකස් කරමින් පවතී. |

**(ආ) පාරිසරික ගැටළු**

**-------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | - | -- | |
| | -------------------------- | ----------- | ----------------------------- |
| (i) | ඒකදේශීය සතුන් හා ශාක මෙන්ම ස්වභාවික ජල පෙරනයක් සහිත ස්වභාවික පිහිනුම් තටාකයකින් යුත් පොම්පකැලය නාගරික වනෝද්‍යානය ප්‍රමාණවත් පරිදි නඩත්තු කර නොතිබීම හේතුවෙන් වර්තමානය වනවිට ජල පෙරනය අක්‍රිය වී ජල තටාකයද අපවිත්‍රවී කිසිවෙකුත් ප්‍රයෝජනයට නොගන්නා තත්ත්වයට පත්ව තිබුණි. ආරම්භයේදී අක්කර 56 ක පමණ භූමි ප්‍රමාණයකින් සමන්විත වූ මෙම වනෝද්‍යානය අනවසර ඉදිකිරීම්, ආපදාවන්ට ලක් වූවන් පදිංචි කරවීම හා විසල් ජල ව්‍යාපෘතිය සඳහා ඉඩ පහසුකම් සපයා දීම නිසා වර්තමානය වනවිට අක්කර 35 කට පමණ සීමා වී තිබුණි. වනෝද්‍යානය සංරක්ෂණය සඳහා 2012 හා 2015 වර්ෂවලදී යෝජනා ඉදිරිපත් කර තිබුණද, එම යෝජනා කිසිවක් 2018 වර්ෂය අවසන් වනවිටත් ක්‍රියාත්මක කිරීමට මහා නගර සභාව අපොහොසත් වී තිබුණි. | රත්නපුර පිහිටි නාගරික වනෝද්‍යානයේ ආරක්ෂාව, නඩත්තුව හා සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමුකළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ii) | ලිඛිත ගිවිසුමකට එළඹීමකින් තොරව පොම්පකැළය රක්ෂිතයෙන් ජල යෝජනා ක්‍රමයක් සඳහා 2014 වර්ෂයේදී ලබාදී තිබුණු අක්කර 02 පර්චස් 28.81 ක් වෙනුවෙන් තක්සේරු වටිනාකම අනුව වර්ෂ 30 ක් සඳහා රු. 34,009,564 ක බදු මුදලක් ගෙවන ලෙස ඉකුත් වර්ෂයේ දී ජල ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත දන්වා තිබුණද, ජල යෝජනා ක්‍රමයට අයත් භූමිය 1978 ජූනි 15 දිනැති ගැසට් නිවේදනයක් මගින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ස්වේච්ඡා පැවරුම් යෝජනා ක්‍රමය යටතේ පවරා ඇති බැවින් බදු මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණි. අදාල කරුණු පිළිබඳව සභාව විධිමත් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | මේ පිළිබඳ සොයාබලා අදාල බදු මුදල් අයකර ගැනීමට හා ඉඩම් පැවරීම පිළිබඳ යථා තත්ත්වය හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (iii) | ජල ව්‍යාපෘතිය වෙනුවෙන් රක්ෂිත භූමියෙන් කපා ඉවත් කර ඇති දැවමය වටිනාකම් සහිත ගස් 71 ක් දැව සංස්ථාවට බාරදුන් බවට කිසිදු තොරතුරක් සභාව සතු නොවීය. | ගස් ඉවත් කිරීම රාජ්‍ය දැව සංස්ථාව මඟින් සිදුකල බවට තහවුරු කිරීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ව්‍යාපෘතිය සඳහා ඉවත් කල සියළු ගස් ඉවත් කිරීම් රාජ්‍ය දැව සංස්ථාව විසින් සිදුකර ඇත. එසේ බිම හෙලන ලද දැව කඳන් සියල්ල රාජ්‍ය දැව සංස්ථාව විසින් රැගෙන ගොස් ඇති අතර සභාවේ කිසිදු ප්‍රයෝජනයකට ගෙන නොමැත. |

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව සිටියද එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 දෙසැම්බර් වනවිටත් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සියල්ල හඳුනාගෙන ඊට අදාල ඉලක්ක හා දර්ශක ඇතුලත් දිගුකාලීන සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ මහජනතාවගේ සෞඛ්‍ය නංවාලීම සඳහා වූ (2019-2022) සිව් අවුරුදු සැලැස්මක් පිළියල කර ඇත. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහා නගර සභාව සතු සිනමා ශාලාවේ බදුකරුගෙන් 2001 මැයි 01 දින සිට 2010 අප්‍රේල් දක්වා කාලයට අදාලව අයවිය යුතු රු. 1,953,000 ක් අයකර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට 2019 මැයි වනවිටත් සභාව කටයුතු කර නොතිබුණු අතර 2017 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා කාලයට අදාලව අයවිය යුතු බදු රු. 772,480 ක් අයකර ගැනීමට ද සභාව අපොහොසත් වී තිබුණි. | සභාව වෙත අයවිය යුතු හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) (i) | නාගරික සංවර්ධන අධිකාරිය මඟින් රත්නපුර මහා නගර සභාවේ ව්‍යාපෘතියක් සඳහා ආසියානු සංවර්ධන බැංකු ණය යෝජනා ක්‍රමය යටතේ රු. 54,566,853 ක ණයක් ලබා දී තිබුණි. නාගරික | අදාල ගැටළුව නිරාකරණය කර ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරගත යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කොට ඇත. අයවිය යුතු තානායම් කුලී මුදල ඉදිරියේදී ලබා ගැනීමට කටයුතු කරන අතර එම මුදලින් ලක්ෂ |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන අධිකාරියෙන් රත්නපුර මහා නගර සභාවට ගෙවිය යුතු තානායම් කුලියෙන් සියයට 50 ක් උක්ත ණය මුදලට හිලව් කර ගන්නා බව එහි අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 29/06/24 හා 2006 අගෝස්තු 31 දිනැති ලිපිය මඟින් දන්වා තිබුණද, අඩු කරගෙන ඇති ණය වාරික ප්‍රමාණය තහවුරු කරගෙන නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ ණය මුදල වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | 50 ක ණය වාරිකයක් ගෙවීමට කටයුතු කරමින් පවතී. |
| (ii) | 2009 වර්ෂයේ සිට 2013 අගෝස්තු දක්වා කාලයට අදාල අයවිය යුතු එකතුව රු. 4,366,496 ක් වූ තානායම් කුලිය නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් අයකර ගැනීමට හෝ ගෙවිය යුතු ණය මුදලට හිලව් කරගෙන තිබේද යන බව තහවුරු කර ගැනීමට හෝ සභාව කටයුතු කර නොතිබුණු අතර, 2013 සැප්තැම්බර් සිට 2017 සැප්තැම්බර් දක්වා වූ කාලය සඳහා තවදුරටත් අයවිය යුතු රු. 156,121 ක් පිළිබඳව පසුවිපරම් කර නොතිබුණි. | අදාල ගැටළුව නිරාකරණය කර ගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරගත යුතුවේ. | ඉහත i පිළිතුර අදාළ වේ. ඒ අනුව තහවුරු ප්‍රකාශ ලබා දෙන ලෙස දන්වා ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අනුමත ප්‍රමාණය ඉක්මවා වැඩ/ක්ෂේත්‍ර කම්කරුවන් 139 ක් හා සෞඛ්‍ය කම්කරුවන් 76 ක් සේවයේ යොදවා තිබියදී විධිමත් අනුමැතියකින් තොරව පිළිවෙලින් කම්කරුවන් 23 ක් හා කම්කරුවන් 58 ක් සේවා ගිවිසුම් මත අදාල ක්ෂේත්‍ර වෙත බඳවා ගෙන තිබුණි. සේවා ගිවිසුම් මත බඳවාගෙන තිබූ එම කම්කරුවන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 19,287,547 ක් වැටුප් හා දීමනා වශයෙන් ගෙවා තිබුණු අතර අතිරික්ත සේවකයින් වැඩි දෙනෙකු පරිපාලන කාර්යාලයේ, පුස්තකාලවල හා පෙර පාසැල්වල නිශ්චිත වැඩ පැවරුමකින් තොරව සේවයේ යොදවා තිබුණි. | සේවා අවශ්‍යතාව අනුව අනුමත කාර්යය මණ්ඩලය සංශෝධනය කරගත යුතු අතර, අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2017 ජුලි 31 දින කම්කරුවන් 20 දෙනෙකු, 2017 අගෝස්තු 14 දින කම්කරුවන් 14 දෙනෙකු සහ 2018 මැයි 01 දින කම්කරුවන් 13 දෙනෙකු බඳවාගැනීම සඳහා අනුමැතිය ලබා දී ඇත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රජයේ නිවාස 05 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිට හිඟ කුලී රු. 112,410 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ කුලී අප්‍රමාදව අයකර ගත යුතුවේ. | හිඟ කුලිය වාරික වශයෙන් අය කරමින් පවතී. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නිසි පරිදි නඩත්තු හා අළුත්වැඩියා නොකිරීම නිසා ඉතා අබලන් තත්ත්වයට පත්ව තිබුණු මහා නගර සභාව සතු රජයේ නිවාස 6 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | නඩත්තු හා අළුත්වැඩියා කටයුතු විධිමත්ව හා අප්‍රමාදව සිදුකළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

### 3.5.2 වත්කම් වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

සභාවට අයත් රත්නපුර, පොම්පකැලේ, ඇතුල්රවුම් පාරේ පිහිටි ඉහල වාණිජමය වටිනාකමකින් යුතු අක්කර 05 ක භූමිය හා එහි පිහිටි ගොඩනැගිල්ල, ටෙනිස් ක්‍රීඩා පිටි දෙක හා බැඩ්මින්ටන් ක්‍රීඩාපිටිය රු. 350 ක වාර්ෂික බදු කුලියකට වර්ෂ 33 ක කාලපරිච්ඡේදයක් සඳහා 2000 නොවැම්බර් 21 දිනැති හා අංක 1603 දරන බදු ගිවිසුම මඟින් රත්නපුර නීතිඥ සංගමය වෙත දීර්ඝ කාලීනව බදු දී තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව සතු දේපලක් වාර්ෂික බදු පදනම මත ලබාදීමේදී අයකල යුතු බදු කුලිය ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත තීරණය කල යුතු අතර, වසර 05 කට වරක්වත් එකී තක්සේරුගත බදු කුලිය සංශෝධනය කල යුතු වේ. තක්සේරුවකින් තොරව යථෝක්ත දේපල බදු දී තිබුණු අතර, බදු කාලය වර්ෂ 18 ක් ගතවී තිබුණද, බදු කුලිය සංශෝධනය කර නොතිබුණි. | වගකිව යුතු පාර්ශව හඳුනාගෙන විනයානුකූලව කටයුතු කළ යුතු අතර, ගිවිසුම් උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගත යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වසර 33 සඳහා අදාල මුළු බදු කුලිය වශයෙන් රු. 11,550 ක් අදාල පර්ශවය විසින් 2006 දෙසැම්බර් 08 දින සභාව වෙත ගෙවා තිබුණද, නගරාධිපතිගේ 2007 ඔක්තෝබර් 12 දිනැති හා අංක ර.ම.ස./වැඅ/02/44 දරන ලිපිය මගින් බදු ගිවිසුම සංශෝධනය කිරීමට අදහස් කර ඇති බවත් ඒ පිළිබඳ විධිමත් පියවරක් ගන්නා තෙක් එම මුදල් භාර නොගන්නා බවත් දන්වා චෙක්පත ආපසු යවා තිබුණි. නමුත් 2018 දෙසැම්බර් වනවිටත් අදාල ගිවිසුම සංශෝධනය කිරීමට හෝ බදු මුදල් අයකර ගැනීමට හෝ සභාව කටයුතු කර නොතිබුණි. | වගකිව යුතු පාර්ශව හඳුනාගෙන විනයානුකූලව කටයුතු කළ යුතු අතර, ගිවිසුම් උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගත යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ඇ) | බදු ගිවිසුම ප්‍රකාරව ගොඩනැගිල්ල කුලියට දී සංගමය උපයන ආදායමින් 2/3 ක් සභාව වෙත ගෙවිය යුතු වුවද, වසර 18 ක බදු කාලය තුල කිසිදු ආදායමක් සභාව වෙත ගෙවා නොතිබුණි. | වගකිව යුතු පාර්ශව හඳුනාගෙන විනයානුකූලව කටයුතු කළ යුතු අතර, ගිවිසුම් උල්ලංඝනය කරන්නන්ට එරෙහිව නීතිමය පියවර ගත යුතුයි. | පිළිතුරු ලබා දී නොමැත. |

**3.5.3** වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ෂ 01 සිට වර්ෂ 05 දක්වා කාලපරිච්ඡේදයක් ධාවන තත්ත්වයේ නොතිබූ වාහන 08 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | අළුත්වැඩියා හා නඩත්තු කටයුතු අප්‍රමාදව සිදුකළ යුතු අතර, වෙන්දේසි කිරීමට නිර්දේශිත වාහන විධිමත්ව වෙන්දේසි කළ යුතුවේ. | අත් ට්‍රැක්ටර් 04 ක් හා කාර් රථයක් ප්‍රථමවර වෙන්දේසි කලද වෙන්දේසි නොවුණු අතර 2019 වසරේ වෙන්දේසියට යොමු කිරීම සඳහා තක්සේරු කිරීමේ කටයුතු සිදු කරමින් පවතියි. ඉතිරි වාහන 03 අලුත්වැඩියා කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | 2016 වර්ෂයේ අනතුරට ලක්වූ සභාව සතු ගිලන් රථය අළුත්වැඩියා කිරීම සඳහා රු. 176,324 ක් වැය කර තිබුණු අතර රක්ෂණයෙන් රු. 114,232 ක් පමණක් ප්‍රතිපූර්ණය කර තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා වගකිව යුත්තන් නිශ්චය කර අලාභ අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

## 3.6 අවිධිමත් ගනුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සීමා සහිත රත්නපුර දිසා සමූපකාර පේෂ කාර්මික සමිතියට බදු දී තිබුණු සභාව සතු පර්චස් 35.5 න් පර්චස් 4.95 ක් පමණක් 2009 වර්ෂයේ දී නැවත පවරා ගෙන තිබුණු අතර ඉතිරි බිම් ප්‍රමාණය නීත්‍යානුකූලව පවරා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. 2014 වර්ෂයේ දී පවරා ගෙන නැවත බදු දී තිබුණු දේපල තුල පිහිටි ගොඩනැගිල්ල බදු ගිවිසුමට පටහැනිව හා සභාවේ අනුමැතියකින් තොරව බදුකරු විසින් ඉවත් කර නව ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. | ඉතිරි බිම් ප්‍රමාණය පවරා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු අතර ගිවිසුම උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශව හඳුනාගෙන සුදුසු පරිදි කටයුතු කළ යුතුවේ. | මෙම ඉඩමේ ඉතිරි බිම් ප්‍රමාණය නැවත නගර සභාවට භාරදීමට කටයුතු කරන ලෙස වරින් වර දන්වා ඇතත් එය නිවැරදිව භාර දී නොමැත. මේ පිළිබඳව සමූපකාර කොමසාරිස්වරයා වෙත ඉඩම නිවැරදිව භාරදෙන ලෙස දන්වා යැවීමට කටයුතු කරමි.<br>මෙම ගොඩනැගිල්ල බදුගෙන ටික දිනකින් අළුත්වැඩියා කිරීමේදී එහි බිත්තියක් කඩා වැටුණු බවත් ඒ බව හිටපු නගරාධිපතිතුමාට දැනුම් දී සැලැස්මක් සකස් කර එය 2014 ඔක්තෝබර් 09 වන දින පැවති සැලසුම් කමිටුවේදී අනුමත කර දුන් බවත් පැරණි සළුපිළිසල ගොඩනැගිල්ල බදුදීමේ ගිවිසුම අධීක්ෂණයට පත්කල කමිටුවට සහභාගි වූ බදුකරු විසින් පවසන ලදී. ඒ අනුව සභාව සතු ඉඩමකට පිටස්තර අයෙක් සඳහා සැළසුමක් අනුමත කර දීම දෝෂ සහිත බව පෙනේ. |
| (ආ) | ලංසු ආරාධනයේ කොන්දේසි අංක 07 ප්‍රකාරව ගොඩනැගිල්ලේ නවීකරණ කටයුතු අවසන් වීමෙන් පසු රජයේ තක්සේරුකරු විසින් නියම කරන මාසික කුලිය බදුකරු විසින් ගෙවිය යුතු වුවත්, නව තක්සේරුව සිදු කිරීම 2019 මාර්තු දක්වා ප්‍රමාද වී තිබුණු අතර, 2014 වර්ෂයේ සිට රු. 20,000 ක මාසික කුලියක් පමණක් අයකරමින් පැවතුණි. | රජයේ තක්සේරුව අනුව අයවිය යුතු කුලිය හිඟ මුදල් ද සමඟ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ගිවිසුම අධීක්ෂණ කමිටුවේ 2018 දෙසැම්බර් 05 වන දින පැවති රැස්වීමේ ගන්නා ලද තීරණයට අනුව 2014 වර්ෂය පදනම් කරගෙන 2019 මාර්තු 08 වන දින නව තක්සේරුවක් ලබාගෙන ඇති අතර එම තක්සේරුවට අනුව 2014 වසරේ සිට හිඟ මුදල් අයකර ගැනීමටද කටයුතු කර ඇත. |

## 3.7 ප්‍රසම්පාදනය

### ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී රු. 3,624,290 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙළ කර ඇත. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

පහත සඳහන් කරුණු හේතුවෙන් වාර්ෂික අයවැය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 62 කට අදාලව එකතුව රු. 45,065,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 38 කට අදාලව එකතුව රු. 14,242,000 ක් වූ මුළු ප්‍රතිපාදනයෙන් සියයට 80 සිට සියයට 99 දක්වා පරාසයක ප්‍රතිශතයක් ඉතිරිවීම් තිබුණි. | සැලසුම් සහගත ලෙස ප්‍රතිපාදන වෙන්කිරීමටත් එම ප්‍රතිපාදන ඵලදායී ලෙස උපයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |

### 4.2 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සබරගමුව පළාතේ පළාත් මාර්ග සංවර්ධන, ග්‍රාමීය යටිතල පහසුකම් සහ සංචාරක අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත සභාව විසින් 2007 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 04 කදී එකතුව රු. 2,822,902 ක් වැයකර කළුගඟ අද්දර ඉදිකර තිබූ නාගරික උයන වල්බිහිවී විනාශ වී | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතු අතර, අරමුදල් ඵලදායී ලෙස උපයෝජනය කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතුවේ. | මෙම භූමිය ළමා උද්‍යානයක් වෙනුවෙන් සකස් කර තිබූ නමුත් වරින්වර ඇතිවූ ගංවතුර හේතුකොට ගෙන උද්‍යානය අවස්ථා කිහිපයකදී සෝදාපාළුවට ලක්වුණි. තවද මෙම උද්‍යානය ඵලදායි ස්ථානයක් බවට පත්කිරීමට විවිධ සැළසුම් |

| | | | |
|---|---|---|---|
| | ඇති බැවින් නිසියාකාරව නඩත්තු කර ප්‍රදේශයේ ජනයාගේ සුභසිද්ධිය උදෙසා යොදවන ලෙස පළාත් මාර්ග සංවර්ධන ග්‍රාමීය යටිතල පහසුකම් හා සංචාරක අමාත්‍යාංශ ලේකම් විසින් 2010 සැප්තැම්බර් 21 දින රත්නපුර මහා නගර සභාවේ නගරාධිපති වෙත උපදෙස් ලබාදී තිබුණද, 2019 මැයි වනවිටද අදාල නාගරික උද්‍යානය ඵලදායී ලෙස භාවිතයට ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | | ක්‍රියාත්මක කිරීමට සැළසුම් කළද ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. නමුත් වර්තමානයේ රත්නපුර නගරයට අත්‍යවශ්‍ය කරුණක් වන වාහන නතරකර තැබීමේ ස්ථානයක් බවට පත්කිරීමට සැළසුම් මේවන විට සකස්කර ඇත. |
| (ආ) | ආසියානු සංවර්ධන බැංකු ණය ව්‍යාපෘතිය - 1632 ශ්‍රී (එස්එෆ්) යටතේ ක්‍රියාත්මක කර තිබූ නාගරික සංවර්ධන හා අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය මඟින් රත්නපුර වෙරළුප මාර්ගය 2005 වර්ෂයේදී සංවර්ධනය කර තිබූ අතර, ඒ සඳහා සභාව විසින් ගෙවිය යුතුව තිබූ ණය මුදල රු. 12,656,450 ක් විය. යථෝක්ත මාර්ගය නිසි පරිදි සංවර්ධනය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වනවිටත් මාර්ගය සභාව වෙත පවරා ගෙන නොතිබුණු අතර, ණය මුදල ගෙවීමටද කටයුතු කර නොතිබුණි. සම්පූර්ණ ණය මුදල දිගින් දිගටම මූල්‍ය ප්‍රකාශනවල ඉදිරියට ගෙනවිත් තිබුණු නමුත් ගැටළුව නිරාකරණය කර ගැනීම සඳහා සභාව කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ණය මුදල සම්බන්ධ ගැටළුව නිරාකරණය කරගෙන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කරගත යුතුවේ. | ඉදිරියේදී මෙම ණය මුදල නිරාකරණය කර ගැනීමට කටයුතු කරමි. |
| (ඇ) | රත්නපුර, දෙමුවාවත, නගර සභා පෙදෙසෙහි පිහිටි සිව්මහල් ගොඩනැගිල්ලක් සඳහා 2011 සැප්තැම්බර් 08 දින අනවසර නිවේදනයක් යවා තිබුණද, ගොඩනැගිල්ල ඉවත් කිරීමට කටයුතු කර නොතිබූ අතර 2012 මැයි 09 දිනැති රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශ අධ්‍යක්ෂගේ ලිපිය අනුව එම ගොඩනැගිල්ල සඳහා සභාවේ සැලසුම් කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන ලෙස අදාල පාර්ශවය වෙත දැනුම් දී තිබුණි. ඒ අනුව 2012 ජුලි 17 දින එම ගොඩනැගිල්ලට අදාල අයදුම්පත | නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුවේ. | 1982 අංක 07 හා 1984 අංක 44 දරන පනත් වලින් සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 23(5) වගන්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතනය වෙත අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට බලය පවරා ඇත.<br>නමුත් 2016 මාර්තු 28 දින රත්නපුර අතිරේක මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 31221 නඩු තීන්දු ප්‍රකාරව රත්නපුර මහා නගර සභාවට නාගරික |

| | | | |
|---|---|---|---|
| | සභාව වෙත ලැබී තිබුණද, ගොඩනැගිල්ල නියමිත පිරිවිතරවලට අනුකූල නොවූයෙන් සැලැස්ම අනුමත කල නොහැකිව තිබුණි. 2019 මැයි වන විටත් අදාල ගොඩනැගිල්ල ඉවත් කිරීමට සභාව අපොහොසත්ව තිබූ අතර, ඒ සඳහා අධිකරණයේ අවසරය ලබා ගැනීමට කටයුතු කරන බව විගණනය වෙත දන්වා තිබුණි. | | සංවර්ධන අධිකාරී පනත යටතේ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට බලයක් නොමැති බව තීරණය කරමින් නියෝගයක් නිකුත් කර ඇත. ඒ අනුව මෙම නියෝගය ඉවත් කර ගැනීමට මහාධිකරණය වෙත කරුණු ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එම මහාධිකරණ තීන්දුව ප්‍රකාරව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ඇ) | දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් එකතුව රු. 5,070,839 ක් වූ ගිණුම් ශේෂ 02 ක් පරීක්ෂා කිරීම සඳහා තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ වාර වාර්තා ඉදිරිපත් කළ යුතුවේ. | පිළිතුරු ලබා දී නොමැත. |